# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2245/13 - 2021 සැප්තැම්බර් මස 15 වැනි බදාදා - 2021.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(1අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන මහරගම නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(1අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ අංක 12 කොට්ටාව නැගෙනහිර කොට්ඨාසයට තේරී පත්වූ රාජපක්ෂ මොහොට්ටිගේ කරෝලිස් අයත්වන්නා වූ අංක 02 දරන ස්වාධීන කණ්ඩායමේ නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති 8 වගන්තිය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම මහරගම නගර සභාවේ අංක 12 කොට්ටාව නැගෙනහිර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් අංක 02හි කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ගල්කන්ද ආරච්චිගේ සුනිල් පියරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහරගම නගර සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්ල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(1අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ගල්කන්ද ආරච්චිගේ සුනිල් පියරත්න, මහරගම නගර සභාවේ අංක 12 කොට්ටාව නැගෙනහිර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
මහරගම නගර සභාව.

2021 සැප්තැම්බර් මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

10 - 181

1A - G 34953 — 30 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*